මගේ අංකය : ED/02/09/සු.සෑ.උ/2022

සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක:353,කෝට්ටේ පර,
රාජගිරිය.

2022.10. 21

සහකාර සුරාබදු කොමසාරිස්වරුන්
සුරාබදු අධිකාරීවරුන් හා සුරාබදු ස්ථානාධිපතිවරුන් මගින්
සියලුම සුරාබදු කෝප්‍රල්වරුන්/කෝප්‍රල්වරියන්/නියාමකවරුන්/නියාමකවරියන්

## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු සැරයන් තනතුරට උසස් කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම -2022

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින තනතුරු 36ක් සඳහා සීමිත තරග විභාගය සහ සේවා පළපුරුද්ද මත උසස් කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2017.01.03 දින අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ 10.2.1 හා 10.2.2. අනුව සුදුසුකම් සපුරන ලද දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක/කෝප්‍රල්වරුන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

2. ඒ අනුව සුදුසුකම් සපුරා ඇති සුරාබදු නියාමක/කෝප්‍රල්වරුන් තම අයදුම්පත පිටපත් 2කින් සකසා එක් පිටපතක් සහකාර සුරාබදු කොමසාරිස් මගින් ඔවුන්ගේ නිර්දේශ සහිතවද අනෙක් පිටපත සෘජුවමද <u>2022 නොවැම්බර් මස 30 වන දින හෝ ඊට පූර්ම ලැබෙන සේ</u> පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් යොමු කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සුරාබදු සැරයන් තනතුර සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කළ යුතු අතර, නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
353 කෝට්ටේ පාර
රාජගිරිය

**03.** <u>**සේවා පළපුරුද්ද හා කුසලතාවය මත උසස් කිරීම**</u>

බඳවා ගැනීම් පරිපාටියේ 10.2 අනුව පුරප්පාඩුව පවතින තනතුරු 36න් 40% ක් කුසලතාවය මත උසස් වීම ලබාදීම සිදු කරනු ඇත. ඒ අනුව <u>තනතුරු 14ක්</u> වෙන් කර ඇත.

එසේම සැරයන් තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව මාසිකව රු.32,010-9X370-17X495-42,270/- ක්වූ වැටුප් පරිමාණයක් හිමි වේ. බඳවා ගැනීම් පරිපාටියේ 8.1 හි සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතුය.

3.1 <u>**සපුරාලිය යුතු සුදුසුකම්**</u>

I. සුරාබදු කෝප්‍රල් තනතුරේ ස්ථිර කර තිබීම
II. සුරාබදු කෝප්‍රල් තනතුරෙහි වසර (05)ක සේවා කාලයක් ඇතුළුව අවම වශයෙන් වසර (08) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අවම වශයෙන් යහපත් කල්ක්‍රියා ලාංඡන දෙකක් (02) ලබා තිබීම.

VI. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

VII. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

### 3.2 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද<br>(සුදුසුකම් ලැබීමට වූ අවම සේවා කාලය හැර දෙපාර්තමේන්තුවේ සුරාබදු කෝප්‍රල්වරයකු වශයෙන් සේවය කර ඇති සෑම වසරකටම ලකුණු 05ක් ද නියාමකවරයකු වශයෙන් සේවය කර ඇති සෑම වසරකටම ලකුණු 03ක් ද බැගින්) | 40 | අදාල නොවේ |
| කාර්ය සාධන ඇගයීම් (පසුගිය වසර 05 සඳහා )<br>➢ අති විශේෂ - 03<br>➢ සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - 02<br>➢ සතුටුදායක - 01 | 15 | |
| ලබා ඇති සාධු සටහන්<br>➢ විශේෂ සාධු සටහන් - 02<br>➢ සාමාන්‍ය සාධු සටහන් - 01 | 20 | |
| රන්වන් ලාංඡනය ලබා තිබේ නම් | 05 | |
| අදාළ ක්ෂේත්‍රයේ පුහුණුව සඳහා<br>➢ ඩිප්ලෝමාවක් සඳහා - 05<br>➢ සති 02 කට වැඩි පුහුණුවක් සඳහා - 02<br>➢ දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහනක් සඳහා - 02<br>(අදාල ක්ෂේත්‍රයේ පුහුණුව හැදෑරීමෙන් අනතුරුව ඉන් ලබා ඇති සහතික පත් අනුව මෙම ලකුණු ලබා දෙනු ඇත) | 10 | |
| සම්මුඛ පරීක්ෂණය සඳහා<br>(ප්‍රායෝගික හැකියාව හා උසාවි රාජකාරි පිළිබඳ) | 10 | |
| එකතුව | **100** | |

### 3.3 උසස් කිරීමේ ක්‍රමය

අයදුම්පත් කැඳවන දිනට ඉහත 3.1 යටතේ ඇති සියලුම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සුරාබදු සැරයන් තනතුරට උසස් කරනු ලැබේ.

## 4 සීමිත තරග විභාගය මත උසස් කිරීම.

බඳවා ගැනීම් පරිපාටියේ 10.2 අනුව පුරප්පාඩුව පවතින තනතුරු 36න් 60% ක් එනම් තනතුරු 22ක් සඳහා සීමිත තරග විභාගය මත උසස් වීම ලබාදීම සිදු කරනු ඇත.

සැ.යු. එසේම 2021.01 20 දිනට පුරප්පාඩුව පැවති සැරයන් තනතුරු 13 සඳහා උසස්වීම් ලබාදිම සඳහා අයදුම්පත් කැඳවීමට අනුව සීමිත පදනම යටතේ ලබාදීමට නියමිතව ඇති තනතුරු 8 ද ඇතුලත්ව මුළු තනතුරු 30ක් සඳහා සීමිත තරග විභාගය පැවැත්විමට කටයුතු කරනු ඇත.

සැරයන් තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව මාසිකව රු.32,010-9X370-17X495-42,270/- ක්වූ වැටුප් පරිමාණයක් හිමි වේ. බඳවා ගැනීම් පරිපාටියේ 8.1 හි සඳහන් පරිදි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතුය.

### 4.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. සුරාබදු නියාමක/ කෝප්‍රල් තනතුරේ ස්ථිර කර තිබීම.
II. සුරාබදු නියාමක/ කෝප්‍රල් තනතුරෙහි අවම වශයෙන් වසර අටක් (08) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අවම වශයෙන් යහපත් කල්ක්‍රියා ලාංජන දෙකක් (02) ලබා තිබීම.
VI. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.
VII. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

### 4.2 සීමිත තරග විභාගයේ ලිඛිත පරීක්ෂණය

බඳවා ගැනීමේ පටිපාටිය අනුව ලිඛිත විභාගය පහත පරිදි ප්‍රශ්න පත්‍ර 02කින් යුක්ත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.සුරාබදු නීතිය හා දෙපාර්තමේන්තු නියෝග | පැය 03 | 100 | 40 % |
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.සුරාබදු නීතිය හා දෙපාර්තමේන්තු නියෝග | 1. සුරාබදු ආඥාපනත, දුම්කොළ බදු පනත, වස විස අබිං හා අන්තරායදායක ඖෂධ පනත පිළිබඳ දැනුම<br>2. දෙපාර්තමේන්තු නියෝග පිළිබඳ දැනුම<br>3. සුරාබදු අත්පොත පිලිබඳ දැනුම |

| | |
|---|---|
| 2. පොදු ප්‍රශ්න පත්‍රය | 1. දෙපාර්තමේන්තුවට අදාල තොරතුරු රැස්කිරීම, වාර්තා සකස් කිරීම, සංඛ්‍යානමය තොරතුරු පවත්වාගෙන යාම.<br>2. රා එකතු කිරීමේ හා මත්පැන් නිෂ්පාදන බලපත්‍ර ලත් ස්ථාන වල තොග හා මුදල් ගණන් බැලීම ආදියට අවශ්‍ය ගණිතමය දැනුම<br>3. භූගෝලීය, සමාජීය හා ආර්ථික පරිසරය<br>4. රාජකාරීමය පොදු දැනුම සහ දෙපාර්තමේන්තුවේ උන්නතියට අදාලව කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීමේ උපක්‍රම |

4.3 <u>යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:</u>

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද | 20 | අදාල නොවේ |
| කාර්ය සාධන ඇගයීම | 20 | |
| ලබා ඇති සාධු සටහන්<br>➢ පූර්වාසන්න වසර පහ (05) තුළ විශේෂ සාධු සටහන් - 05<br>➢ සාමාන්‍ය සාධු සටහන් - 03 | 30 | |
| ලාංඡන ලබා තිබේ නම්<br>(පලාවන් **3**-ලකුණු 01, රතු **1**- ලකුණු 02, රතු **2**- ලකුණු 03,<br>රතු **3**- ලකුණු 4,රන්වන්-ලකුණු 05) | 05 | |
| තනතුරට අදාල පුහුණුවීම් | 10 | |
| උසස් අධ්‍යාපන සුදුසුකම්<br>(ඩිප්ලෝමා-ලකුණු 05පැය 60ට වැඩි සහතික පත්‍ර පාඨමාලා-ලකුණු 03) | 05 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව | 10 | |
| එකතුව | 100 | |

4.4 <u>උසස් කිරීමේ ක්‍රමය:</u>

අයදුම්පත් කැඳවන දිනට ඉහත 4.1 යටතේ ඇති සියලුම සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ලිඛිත විභාගයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයන ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර ලිඛිත විභාගය සමත් වන අය අතරින් උසස් කිරීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ හා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සුරාබදු සැරයන් තනතුරට උසස් කරනු ලැබේ.

එම්.ජේ ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්

එම්. ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක: 353, කෝට්ටේ පාර, රාජගිරිය